ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

3G ඉතුරුම් ගිණුම්

නිමැවුමේ ස්වභාවය	පාරිභෝගික ප්‍රතිලාභ	ආරම්භක තැන්පතු හා ගාස්තු	සුදුසුකම	ප්‍රධාන නියම හා කොන්දේසි
විශේෂ ඉතිරිකිරීම	ඔබ මුදල් වියදම් කරන අතරතුර ඔබේ පවුලේ පරම්පරා තුනකට අයත් අයගේ ගිණුමකට මුදල් තැන්පත්කිරීමට ඉඩසලසනු ලැබේ. BOC ඩෙබිට් කාඩ්පතින් භාණ්ඩ හා සේවා මිලදී ගන්නා විට, Rs.100/, Rs.200/, Rs.500/- or Rs.1,000/- යන ඔබ වියදම් කළ මුදල ඊළඟ ආසන්නතම 100 ගුණාකාරයට [ලියාපදිංචියේදී ගනුදෙනුකරු විසින් තීරණය කරන පරිදි] වටයනු ලැබේ. ගනුදෙනුකරුගේ ගිණුමෙන් ඔහු වියදම් කළ මුදල සහ වැටයූ මුදල අතර ඇති වෙනස අඩු කරගන්නා අතර කාඩ්පත් හිමියා විසින් නම්කරන ලද ගිණුමකට/ ගිණුම්වලට එය බැර කරනු ලැබේ. [උදා: රු.923/-කට භාණ්ඩ මිලදීගෙන එය ඩෙබිට් කාඩ්පතින් ගෙව්වේනම්, එම මුදල රු.Rs. 1,000 /-ට වටයා එහි වෙනස වන Rs.77 /- නම් කළ ගිණුමට බැර කරනු ලැබේ.]	ගාස්තු අදාළ නොවේ.	• ඩෙබිට් කාඩ්පතක් තිබෙන හා තමන්ගේ බැංකු ගිණුම්වල ප්‍රමාණවත් ශේෂයන් ඇති සියලුම ගිණුම් හිමියන්ට මෙය විවෘත වේ. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** • 3G ඉතිරිකිරීම් සඳහා ඇති විශේෂ අයදුම්පත පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ගෙනගොස් භාරදෙන්න. ජාතික හැඳුනුම්පත, NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රය.	• නිමැවුමට අදාළ සියලුම නියම හා කොන්දේසි සඳහා අයදුම්පත බලන්න.

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.
- දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 ෆැක්ස්: +94 11 243 5815 විද්‍යුත් ලිපිනය: bocexmgt@boc.lk වෙබ් අඩවිය: https://www.boc.lk
- තැපැල: ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.